ආර්ථිකය




# එලොව පොල් දකින පොල් බිම්

ලසන්ත දිසානායක

ලෝකයේ පොල් වගා කරන ප්‍රදේශ සීමා වී ඇත. සමකයේ සිට 22° උතුරට හා දකුණට පිහිටා ඇති ප්‍රදේශයේ ලෝකයේ පොල් වගා කරන ප්‍රදේශ සීමා වී ඇත. අනෙක් ප්‍රදේශවල ද සුළු ප්‍රමාණයක් වැවේ. නමුත් වර්ධනය අඩු ය. වර්ධනය වුව ද ඵලදාව අඩු ය. එමනිසා වාණිජමය වැදගත්කමක් නැත. ලෝකයේ පොල් නිපදවන රටවල් අතරට ඉන්දියාව, ඉන්දුනීසියාව, පිලිපීනය, ලංකාව, මැලේසියාව, මධ්‍යම ඇමරිකාව, අප්‍රිකාව වැනි රටවල් අයත් ය. වැඩියෙන් ම පොල් නිපදවන රට වනුයේ ඉන්දුනීසියාව යි. එය ලෝක නිෂ්පාදනයෙන් 31% කි. දෙවනුව පිලිපීනය අයත් කර ගන්නා අතර 21% කි. පිලිපීනය කොප්පරා ද විශාලව ම නිපදවන රට වේ. එය ලෝක නිෂ්පාදනයෙන් 30% ක් අයත් කර ගනී.

ශ්‍රී ලංකාවේ පොල්වගාව එහි කෘෂිකර්මයේ ඉතා ඉහළ ස්ථානයක් අයත් කරගෙන ඇත. භූමි භාවිතයෙන් පොල් දෙවනි වන්නේ වී වගාවට පමණි. වී මගින් 31.3% ක් අත්කරගෙන ඇති අතර පොල් වගාව විසින් 21.7% අත්කරගෙන ඇත. මෙයිනුත් 90% ක් ම කුඩා ඉඩම් හිමියන්ට අයත් භූමි වේ. එනම් අක්කර 20 ට අඩු බිම් ප්‍රමාණයක් ඇති අය යි. ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනය වාර්ෂිකව පොල් ගෙඩි මිලියන 2000 ත් 3000 ත් අතර වේ. අපගේ ඉලක්කය වන්නේ පොල්ගෙඩි මිලියන 4000 කි. නමුත් එය සපුරාලීමට ඇති බාධක ලෙස කාලගුණික සාධක හා පොහොර යෙදීම අඩුවීම වැනි කරුණුවලට අමතරව මෙම වගාබිම්වලට අලුතින් පැන නැගුණු ප්‍රශ්නයක් වන පොල් ඉඩම් කට්ටි කිරීම ද එයට බාධක බලපා ඇත.

ලංකාවේ පොල් වගා කරන ප්‍රදේශ ගත්විට පොල් ත්‍රිකෝණයට අන්වන කොළඹ, කුරුණෑගල, හලාවත වන ප්‍රදේශවල ඉහළ පොල් එලදාවක් ලබාගන්නා ප්‍රදේශ වේ. මෙම ප්‍රදේශවල එක් එක් ප්‍රදේශවලට ආවේණික වූ පොල් අස්වැන්නක් දේශීය නිෂ්පාදනයට ලබා දේ. ඒ අතරින් හොඳ දයකත්වයක් ලබාදෙන ප්‍රදේශයක් ලෙස ගම්පහ දිස්ත්‍රික්කය ගත හැකි ය. මෙම පොල් ඉඩම් කට්ටි කිරීම වැඩිපුර ම ඒවා කට්ටි කිරීම සිදුවී ඇති දිස්ත්‍රික්ක ලෙස කළුතර, ගම්පහ, කුරුණෑගල ගත හැකිය. මේ අතර ගම්පහ ප්‍රමුඛස්ථානයක් ගනී.



G.H.S. ගොඩවිට

ගම්පහ දිස්ත්‍රික්කයේ පොල් වගාවේ සියලු ම සංවර්ධන වැඩ සිදුවනුයේ ගම්පහ පොල් වගා කිරීමේ මණ්ඩලය මගිනි. ඒ මගින් පොල් ඉඩම් සංවර්ධනය සඳහා දරන දයකත්වය හා ඒවායේ කාර්යභාරය හා පොල් ඉඩම් කට්ටි කිරීමේ දී මණ්ඩලයේ වගකීම් පිළිබඳ විමසීම සඳහා අප ගම්පහ පොල් වගා කිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය කළමනාකරු වන G.H.S. ගොඩවිට මහතා හා යෙදුන පිළිසඳරක දී ගම්පහ දිස්ත්‍රික්කයේ පොල්වගාව පිළිබඳ වර්තමාන තත්ත්වය ගැන අපට පැහැදිලි කරමින් කියා සිටියේ ය. ගම්පහ දිස්ත්‍රික්කය තුළ 1982 කළ සංගණනයකට අනුව පොල් අක්කර 1,58552 ක භූමි භාගයක් ඇත. මෙම භූමි ප්‍රමාණයෙන් යැපෙන ඉඩම් හිමියන්ගේ ප්‍රමාණය 1, 06860 වන අතර එය වතු වශයෙන් ගත් කළ පොල් වතු 705 පමණ වෙයි. ගම්පහ දිස්ත්‍රික්කයේ ඇති දේශගුණික හා පාංශු සාධකවලට ගැළපෙන ලෙස පොල්වගාවෙන් වර්ෂයකට උපරිමව පොල් අක්කර 1 කින් ලබාගත හැකි පොල් ගෙඩි සංඛ්‍යාව 2500 ත් 3000 ත් අතර අගයක් වේ. නමුත් එය 1999 වර්ෂයේ දී වාර්තාගත ලෙස ඉහළ ගිය බව වාර්තා වී ඇත. එයට දේශගුණික සාධක බලපා ඇත.

කෙසේ වෙතත් පොල් වගා කිරීමේ මණ්ඩලයක් ලෙස අපගේ කාර්යභාරය වනුයේ පොල් වගාව සංවර්ධනය කිරීම විනා එය කට්ටි කර විකිණීම නොවේ. ඇත්තට ම පොල් ඉඩම් කට්ටි කිරීමේ කාර්ය සිදු වන්නේ අප අතින් නොව ප්‍රාදේශීය සභාව මගිනි. එය පාලනය වේ.

පොල් ඉඩම් හිමියකුට තම ඉඩම කට්ටි කර විකිණීමට අවශ්‍ය නම් පළමුව ඉඩම් හිමියා සිය ඉඩම් කට්ටි කිරීමේ අවශ්‍යතාව ප්‍රාදේශීය සභාවට දැනුම් දීමක් සිදු කරයි. අනතුරුව එම කාර්යාලය මගින් අපගේ පොල් සංවර්ධන මණ්ඩලයට ඒ බව දැනුම් දෙන අතර එම ඉඩමේ පොල් වගාවට සුදුසු නුසුදුසු භාවය පරීක්ෂාකර අප වාර්තාවක් පිළියෙළ කරයි. එයට පසේ ස්වභාවය, භූමියේ ස්වභාවය, වර්තමාන පොල් වගාවේ තත්ත්වය ජල පහසුකම් වැනි කරුණු සැලකිල්ලට ගනී. අප විසින් සකස් කළ වාර්තාව අපගේ ප්‍රධාන කාර්යාලයට යවයි. අනතුරුව එම ඉඩම් කට්ටි කිරීම සුදුසු නුසුදුසු භාවය ප්‍රාදේශීය සභාවට දැනුම් දෙයි. අවාසනාවකට බොහෝ විට මෙම වාර්තාව කුමන එකක් වුවත් පොල් ඉඩම කට්ටි කිරීම අවසානයට සිදුවේ. එසේ කට්ටි කළ ඉඩම් එහි අයිතිකරුගේ සමාගම් විසින් ඔවුනට අවශ්‍ය ආකාරයට ඉඩම සකස් කිරීම සිදුකරන අතර එහිදී මාර්ග ඉදි කිරීම් විදුලි රැහැන් ඇදීම් වැනි දේ සිදු කිරීමට විශාල පොල් ගස් සංඛ්‍යාවක් විනාශ කරනවා.



ඉත් නොනවතින ක්‍රියාදාමය වෙන්දේසියක් මඟින් ඉතා කුඩා ඉඩම් කට්ටි පුද්ගලිකව මිලදී ගැනීමෙන් පසු ඔවුන්ගේ පෞද්ගලික අවශ්‍යතාවයන් සඳහා එනම් නිවාස ව්‍යාපාරික ස්ථාන සෑදීමට එම ස්ථානවල ඇති අනෙකුත් වගාවන් ද විනාශ කිරීමට සිදුවේ.

මෙසේ අප පොල් වගා කිරීමේ නිලධාරීන් ලෙස මේ ප්‍රශ්නය ගැන මේ ආකාරයට දුටුව ද පොල් වගාවට අමතරව වැඩිවන ජනගහනය සමඟ වන අවශ්‍යතාවයන් සඳහා මෙම ඉඩම් කට්ටි කිරීම සිදු වන බව කිව්ව ද එහිද සාධාරණත්වයක් ඇත. එමනිසා පොල් ගැන ම කථා කිරීමට පමණක් අපට සීමාවිය නොහැකි ය.



**ඇත්තට ම මේ ඉඩම් ලොකු පොල්වත්තක්. නමුත් දැන් මේකේ පොල් ගස් තියෙන්නේ කීපය යි. එයට හේතුව කුඩා කට්ටිවලට කැඩුවාට පසු ඒවායේ මිනිසුන් පොල් ගස් කපනවා. එතකොට ඉතිරිවන්නේ මොනව ද? මේක ප්‍රශ්නයක් බව අප දන්නවා. නමුත් අපිට ගත යුතු වෙන විකල්පයක් දැනට නම් පේන්න නෑ.**



නමුත් පොල් වගා කිරීමේ මණ්ඩලය ලෙස පොල් වගාව ශ්‍රී ලංකාව තුළ තගා සිටුවීමට විශාල පරිශ්‍රමයක් අප දරනවා. දේශීය පරිභෝජන සඳහා ප්‍රමාණවත් පොල් එළදාවක් අපේ රට තුළ දැනට තිබෙනවා. නමුත් අවාසනාව ලෙස මේ අලුත් ප්‍රශ්න ලෙස යම් කාලයකදී පොල් සඳහා ද විදේශික රටවලින් සහය පැතීමට සිදුවනු ඇත.

ඒ අනාගතයේ ඇති විය හැකි තත්ත්වයන් වැලැක්වීමට අප මණ්ඩලය විවිධ උපක්‍රම යොදා තියෙනවා. ඒ අතරින් නැවත පොල් වගා කිරීමේ ව්‍යාපෘති ආරම්භ කර ඇති අතර ඒවා සඳහා ගොවීන්හට සහනදායී ණය ක්‍රමයක් මණ්ඩලය මඟින් හඳුන්වා දී ඇත. මීට අමතරව සෑම පොල් ඉඩමක් සඳහා නොමිලේ පොල් පැළ ලබාදීමේ දී හා ගොවීන් දැනුවත් කිරීම සඳහා සම්මන්ත්‍රණ වැඩමුළු පුහුණු පන්ති වැනිදේ මඟින් ගොවීන් පොල් වගාව ගැන දැනුවත් කිරීම හා ඒවායේ දී ඇතිවන ගැටළු තත්ත්වයන් මගහැරීමට අප දායකත්වයක් ලබා දෙනවා.

අවාසනාවකට මෙම පොල් ඉඩම් කට්ටි කිරීම නමැති අලුත් ප්‍රශ්නය දරුණු ලෙස මෙම වගාවට බලපාන තත්ත්වයක් වර්තමානයේ උද්ගත වී තිබෙනවා. නමුත් එය ඉතා ක්‍රමික වැඩ පිළිවෙලක් යටතේ සිදු කිරීමට පුළුවන් බව යි අපගේ හැඟීම.

මෙම ගැටළුවට ප්‍රායෝගික දායකත්වයක් සපයා ඇති කුඩා ඉඩම් කට්ටි මිලදී ගත් ගැනුම් කරුවෙකු වන සිසිර කුමාර මහතා ප්‍රකාශ කළේ මෙවැනි අදහසක් ය.

පොල් ඉඩම් කට්ටි කර විකිණීමෙන් පොල් වගාවට හානියක් වන බව අප දන්නවා. නමුත් ඇත්තට ම අපිට පොලුත් ඕනෑ, ඉන්න තැනකුත් ඕනෑ. මේ ප්‍රශ්න දෙකේ දී අප වැඩි සැලකිල්ලක් දැක්විය යුත්තේ ඇත්තට ම අපේ නිවාස ප්‍රශ්නය යි. ලෝකය දියුණු වෙනවා කියලා කියනවා. ඒ සමඟ අපි දියුණු වෙන්න ඕනෑ. නමුත් ලංකාව ගත් කළ එම දියුණුව නාගරික ප්‍රදේශවලට සීමාවෙලා. මේ නිසා නගරයට රොක්වන ජනගහනය ද වැඩි වේ. මෙලෙස මිනිසුන් නගරයට රොක් වීමේ ප්‍රතිඵලයක් ලෙස ඒ ආසන්නයේ ඇති ඕනෑ ම ඉඩමකට ඉතා ඉහළ වටිනාකමක් ලැබිල තියෙනවා. මේවායින් ප්‍රයෝජන ගන්නෙ ඉඩම් වෙන්දේසි කරුවන්. ඔවුන් මේ මිනිසුන්ගේ ප්‍රශ්නය දැනගෙන එය ඔවුන්ගේ වාසියට හරවාගෙන සිය ව්‍යාපාර පවත්වාගෙන යනවා. මේ නිසා ප්‍රධාන නගරයක් වටා ඇති බොහෝ ඉඩම් මේ ලෙස කට්ටි කර තිබේ.



ඇත්තට ම මේ ඉඩම් ලොකු පොල්වත්තක්. නමුත් දැන් මේකේ පොල් ගස් තියෙන්නේ කීපය යි. එයට හේතුව කුඩා කට්ටිවලට කැඩුවාට පසු ඒවායේ මිනිසුන් පොල් ගස් කපනවා. එතකොට ඉතිරිවන්නේ මොනව ද? මේක ප්‍රශ්නයක් බව අප දන්නවා. නමුත් අපිට ගත යුතු වෙන විකල්පයක් දැනට නම් පේන්න නෑ.

මේ ලෙස ඉඩම් කට්ටි කර විකිණීම නිසා පොල් වගාවට පමණක් නොව පාරිසරික හා සමාජයීය ප්‍රශ්න ගණනාවක් ද අලුතින් පැන නගිනවා. මෙම කට්ටි කර ඇති ඉඩම්වලට පුළුල් මාර්ග පහසුකම් හෝ වෙනත් පොදු පහසුකම් කිසිවක් නෑ. ඊට අමතරව රු. 2.50 ට 3.00 ට තිබූ පොල් ගෙඩිය අද රු. 10, 12 දක්වා ඉහළ නැගීමට ද මේ ඉඩම් කට්ටි කිරීම බලපා තියෙනවා. නමුත් ජනගහනය වැඩිවීම වැනි පොදු ප්‍රශ්න සමඟ මෙවැනි සිදුවීම් වළක්වන්න තියෙන ක්‍රම බොහොම අඩු යි. ඒවා නිසි ක්‍රමවත් වැඩ පිළිවෙලක් යටතේ කළොත් මෙය සමතුලිතව පවත්වා ගැනීමට අපහසු නෑ.

❐

ඡායාරූප-
**ලක්ෂ්මන් විමලරත්න**